---

## පදියතලාව ප්‍රාදේශීය සභාව
## අම්පාර දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 01 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 නොවැම්බර් 16 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**1.2 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පදියතලාව ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම් හැර 2010 දෙසැම්බර් 31 දිනට පදියතලාව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 අනුකූල නොවීම්**

**පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.**

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) 13 වන රීතිය | අයවැය ලේඛනයේ සහතික කළ පිටපතක් මුදල් වර්ෂය ආරම්භ වීමට ප්‍රථම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් නොකෙරිණ. |
| (ii) 17 වන රීතිය | ප්‍රා.ස 21 ප්‍රකාරව උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iii) 29 වන රීතිය | එකතුවන මුදල් දිනපතා බැංකු ගතකර නොතිබුණි. |

(iv) 164 වන රීතිය — අදාල ගිණුම් ලියකියවිලි ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ දිනපතා පරික්ෂා කර නොතිබුණි.

(v) 168 (1) වන රීතිය — ඉකුත් වර්ෂය සඳහා වූ ගිණුම් සාරාංශයෙහි පිටපතක් ලැබීම් හා ගෙවීම් වවුචර් වර්ගීකරණ ප්‍රකාශයද සමග එක් එක් වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරිණි.

(ආ). **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි**

387 — ප්‍රධාන මුදල් පොතේ ශේෂය අයිරා ගැන්වී තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්ථන වියදම රු.1,043,722 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,546,048 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව ඉරිදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු "000" | රු "000" | රු "000" | රු "000" | රු "000" | රු "000" |
| වරිපනම් හා බදු | - | 3 | - | - | - | - |
| බදු කුලී | 1,462.5 | 872 | 590.5 | 1,486 | 1,108 | 436 |
| බලපත්‍ර ගාස්තු | 330.0 | 312.9 | 17.1 | 230 | 265 | -- |
| වෙනත් | 5,797.9 | 5,572.7 | 225.2 | 410 | 541 | -- |

**2.2.2 උසාවි දඩ මුදල්**

විවිධ ආඥාපනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.958,002 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

**2.2.3 මුද්දර ගාස්තු**

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දරගාස්තු වටිනාකම ඉදිරිපත්කර නොතිබුණි.

**2.2.4 බදු කුළී.**

2010 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතුව තිබූ රු. 164,710 ක බදු කුලී ආදායම් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**2.3 වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම්, විචලනයන්ද සමග පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | "000" | "000" | "000" | "000" | "000" | "000" |
| පෞද්ගලික පඩිනඩි | 5,926 | 5,723 | 203 | 5,926 | 5,435 | 491 |
| අනෙකුත් | 1,559 | 2,018 | (459) | 1,559 | 1,604 | (45) |
| උප එකතුව | 7,485 | 7,741 | (256) | 7,485 | 7,039 | 446 |
| ප්‍රාග්ධන වියදම් | - | 28,288 | (28,288) | - | 11,461 | (11,461) |
| මුළු එකතුව | **7,485** | **36,029** | **(28,544)** | **7,485** | **18,500** | **(11,015)** |

**2.4 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතීයික | 11 | 04 |
| ප්‍රාථමික | 11 | 13 |
| වෙනත් (අනියම්, තාවකාලික) | 03 | 02 |

**2.5 වත්කම් කළමනාකරණය**

**අයවීමට ඇති සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු. 1,882,039 කි.

**2.6 අවිධිමත් ගනුදෙනු**

(අ) චෙක්පත් වලින් ගනුදෙනු කිරීමේදී අදාල ආයතනයේ නමට චෙක්පත් ලියවිය යුතු වුවද, කර්මාන්ත ගිණුමෙන් ගෙවීම් කිරීමේදී මුදල් චෙක්පත් ලියා තිබුණි.

(ආ) 2010.06.30 දින කරන ලද රු.30,000 ක ගෙවීමක් සඳහා ගෙවීම් වවුචරය ඉදිරිපත්කර නොතිබුණ අතර, චෙක්පත් පිළිපතෙහි ද විස්තර කිසිවක් ලියා නොතිබුණි.

**2.7 අභ්‍යන්තර විගණනය**

ආයතන තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

(අ). ගිණුම්කරණය

(ආ). මූල්‍ය පාලනය